# තනතුරු - ඇබෑර්තු

## වැලිගම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

වැලිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති වැලිගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :-

| 01. | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| 1. | කාර්යාල කාර්ය සහායක | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් (06) සමත්විය යුතුය. |

02. *වැටුප් පරිමාණයන් :*

1. කාර්යාල කාර්ය සහායක : රු. 24,250 -250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 (PL 1 - 2016)

03. *පොදු සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු අතර, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන සහතිකයට ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන යොද තිබිය යුතුය.)

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදළ නොවේ.)

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) වැලිගම ප්‍රාදේශීය සභාවේ දැනට අදාළ තනතුරේ හෝ වෙනයම් තනතුරක අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම් මත සේවය කරන සේවකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(vi) අයදුම්කරුවන් ඉහත දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

(iii) වැන්දඹු පුරුෂ හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය සඳහා මුදල් අය කෙරේ.

(iv) පත්වීම් ලැබූ දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම වසර තුන ඇතුළත තනතුරට අදාළව පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(v) මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ කොන්දේසිවලටද, මුදල් රෙගුලාසිවලටද, දකුණු පළාත් සභාව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලටද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්වල විධිවිධානවලටද වැලිගම ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.



05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව පිළියෙල කරන ලද අයදුම්පත 2020.09.18 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, වැලිගම ප්‍රාදේශීය සභාව, වැලිගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

අදාළ අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් සහිතව)
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික
(vi) දැනටමත් මෙම සභාවේ අදාළ තනතුරක හෝ වෙනයම් තනතුරක අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම් පදනම මත සේවය කරන්නේ නම් එම පත්වීම් ලිපි සහ සහතික

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

පුෂ්ප කුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2020 අගෝස්තු මස 26 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය සභා කාර්යාලය.

#### ආදර්ශ අයදුම්පත්‍රය

***පළාත් රාජ්‍ය සේවයේ වැලිගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික මට්ටම ශිල්පීය නොවන සේවයේ III වැනි පන්තියේ කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා බඳවා ගැනීම***

(අයදුම් කිරීමේදී අදාළ තනතුර පමණක් ඇතුළත් කරන්න.)

01. (1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................
(2) මුලකුරු සමග නම :..........................................................

02. ස්ථිර ලිපිනය :..........................................................

03. ග්‍රාම නිලධාරී වසම හා අංකය :..........................................................

04. උපන් දිනය : අවුරුද්ද :.................... මාසය :.................... දිනය :....................

05. ඉල්ලුම්පත භාරගන්නා අවසාන දිනට වයස : අවු. :...............මාස :................. දින :..............

06. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................

08. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය :..........................................................

09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද යන වග :..........................................................



10. අධ්‍යාපන සුදුසුකම් :..........................................................

11. වෙනත් සුදුසුකම් :..........................................................

12. වෘත්තීය සුදුසුකම් :..........................................................

13. සේවා පළපුරුද්ද :..........................................................

1. දැනට සේවය කරන ආයතනය :..........................................................
2. දැනට දරන තනතුර :..........................................................
3. එම තනතුරට පත් වූ දිනය :..........................................................
4. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :..........................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි.

..................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.............................

#### දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්කරුවන..........................:............................මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ.:..........................:............................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරමින් අදාල අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

..............................
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම:................................................
පදවි නාමය:................................................
දෙපාර්තමේන්තුව/ආයතනය:................................................
දිනය:................................................

09-364